# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 2073/11 - 2018 මැයි මස 30 වැනි බදාදා - 2018.05.30

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්. ඩී. බී. 21/78(xi)

### 1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 18වන වගන්තිය සමග කියවිය යුතු 91 වන වගන්තිය යටතේ විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව විසින් සාදනු ලබන නියමාවලිය.

ලේකම්,
විශ්ව විද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාව.

2018 මැයි මස 28 වැනි දින,
කොළඹ දී ය.

නියමාවලිය

1. මේ නියමාවලිය 2018 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල (සංශෝධන) නියමාවලිය යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. 2015 මාර්තු මස 17 වන දින අංක 1906/8 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරනු ලැබ 2016 අගෝස්තු මස 25 වන දින අංක 1981/79 දරන *අති විශෙෂ ගැසට් පත්‍රයේ* පළ කරන ලද නියමාවලිය මගින් අවසන්වරට සංශෝධිත 2016 අංක 1 දරන විශ්වවිද්‍යාල අර්ථසාධක අරමුදල නියමාවලිය පහත දැක්වෙන පරිදි මෙයින් තවදුරටත් සංශෝධනය කරනු ලැබේ :-

(1) එහි 10 වන ඡේදයේ, (2)(ආ) අනු-ඡේදයේ (ii) වන අයිතමය ඉවත්කර ඒ වෙනුවට පහත දැක්වෙන අයිතමය ආදේශ කිරීමෙන් :-

"(ii) සේවක අර්ථසාධක අරමුදල සම්බන්ධයෙන් කාර්ය ඉටු කිරීම සහ කර්තව්‍ය කිරීම සඳහා මූල්‍ය මණ්ඩලය විසින් මහ බැංකුවට පත් කරනු ලබන නිලධාරීන් අතරින්, මහ බැංකුවේ අධිපතිවරයා විසින් නම් කරනු ලබන නියෝජිතයෙක්;" ;

(2) එහි 26 වන ඡේදයේ -

(අ) ''පනත'' යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

''මහ බැංකුව'' යන්නෙන්, (422 අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුව අදහස් වේ;'' ;

(ආ) ''කොමිෂන් සභාව' යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

" ''සේවක අර්ථසාධක අරමුදල'' යන්නෙන්, 1958 අංක 15 දරන සේවක අර්ථසාධක අරමුදල් පනතින් පිහිටුවන ලද සේවක අර්ථසාධක අරමුදල අදහස් වේ;'';



*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

''මහ බැංකුවේ අධිපතිවරයා'' යන්නෙන් (422 වන අධිකාරය වූ) මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ අධිපතිවරයා අදහස් වේ; '' ; සහ

(ඈ) ''උසස් අධ්‍යාපන ආයතනය'' යන වචනයේ අර්ථ නිරූපණයට ඉක්බිතිව ම, පහත දැක්වෙන අර්ථ නිරූපණය ඇතුළත් කිරීමෙන් :-

" ''මුදල් මණ්ඩලය'' යන්නෙන්, 422 වන අධිකාරය වූ මුදල් නීති පනත යටතේ පිහිටුවන ලද ශ්‍රී ලංකා මහ බැංකුවේ මුදල් මණ්ඩලය අදහස් වේ; ''.

06 - 610

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.